# <u>දැන්වීමයි</u>

## **2021/2022 අධ්‍යයන වර්ෂය (ප්‍රථම වසර සිසුන්) සඳහා ශිෂ්‍යාධාර වාරික ගෙවීම් කිරීම - මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**

2021/2022 (ප්‍රථම වසර) අධ්‍යයන වර්ෂයට අදාළව ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ලැයිස්තුව (SELECTED LIST), අපේක්ෂිත ශිෂ්‍ය ලැයිස්තුව (PENDING LIST) සහ ඔවුන්ගේ ගිණුම් විස්තර ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇත. ඊට අමතරව ප්‍රතික්ෂේපිත ශිෂ්‍ය ලැයිස්තුවද (REJECTED LIST) ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇත.

**ශිෂ්‍ය සුබසාධක වෙබ් අඩවිය - welfare.sjp.ac.lk**

ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලැබූ, අපේක්ෂිත සිසුන්ගේ නාම ලේඛන සහ ඔවුන්ගේ ගිණුම් විස්තර පමණක් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ කාර්යාලයේ තබා ඇති අතර එහි සඳහන් ගිණුම් අංක පරීක්ෂා කර එම ගිණුම් අංකවල නිවැරදිතාවය තම අත්සන යොදා තහවුරු කරන ලෙස සිසුන්ට දන්වා සිටිමි.

නාම ලේඛනයෙහි සඳහන් කර ඇති **ගිණුම් අංකයෙහි යම් නිවැරදි කිරීම් සිදු කිරීමට ඇති සිසුන් සහ තම ගිණුම් විස්තර ඉදිරිපත් නොකළ සිසුන් මහජන බැංකු පාස් පොතේ නිවැරදි ගිණුම් අංකය සහිත මුල් පිටුවේ පිටපතක තම ලියාපදිංචි අංකය, ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකතන අංකය සඳහන් කර පීඨ කාර්යාලයට ගෙනැවිත් භාරදිය යුතුය.** (බැංකු ගිණුමක් නොමැති සිසුන් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක බැංකු ගිණුමක් ආරම්භ කර ගිණුම් විස්තර ඉදිරිපත් කළ යුතු අතර ඔබට අයත් ගිණුමක් මේවන විටත් තිබේ නම්, නව ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය නොවේ.)

**ගිණුම් අංක ලබා නොදෙන සිසුන් සඳහා සහ අත්සන් ලේඛනයේ අත්සන් නොකරන සිසුන් සඳහා ශිෂ්‍යාධාර වාරික මුදල් ගෙවීම් කිරීම තාවකාලිකව අත්හිටුවන අතර 2023.06.12 දිනට** පෙර අදාළ නාම ලේඛනයේ අත්සන් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

ශිෂ්‍යාධාර සම්බන්ධයෙන් ඔබට කිසියම් ගැටලුවක් ඇත්නම්, කරුණාකර ඔබගේ ගැටලුව usjbursary@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ 0112881731, 0112803471 ඔස්සේ යොමු කරන්න.

නියෝජ්‍ය ලේඛකාධිකාරී

නියෝජ්‍ය ලේඛකාධිකාරී/ ශිෂ්‍ය සුබසාධක අංශය